**දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතියේ - සංරචකය - I 2014**

---------------------------------------------------------------------------

දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතියේ - සංරචකය - I 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2013 අගෝස්තු 19 දින එළඹි අංක 5228 - එල්කේ දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------

මූල්‍ය ගිවිසුම අනුව, එවකට සෞඛ්‍ය අමාත්‍යාංශය වර්තමානයේ, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමින් හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් පළාත් මට්ටමින් ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ. ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ල අනුව, 2013 සිට 2017 වර්ෂය දක්වා ජාතික සෞඛ්‍ය සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය සහාය සැපයීමට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. මන්ද පෝෂණය හා බෝ නොවන රෝග පිළිබඳ අභියෝග සඳහා යහපත් ප්‍රතිචාර දැක්වීමට හැකිවන පරිදි මහජන සෞඛ්‍ය පිළිබඳ කාර්යසාධන ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ සංරචක - I සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 190 කට සමාන විගැහි (SDR) මිලියන 123.3 ක් විය. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජුලි 01 දින ආරම්භ කරන ලද අතර 2018 සැප්තැම්බර් 30 වන විට නිම කිරීමට නියමිතය. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් පිළිබඳ අදහස් දැක්වීම් මෙම වාර්තාවේ අඩංගු වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම්වල සම්පාදනයක් වන මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු

කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

2. මූල්‍ය ප්‍රකාශන
----------------

2.1 මතය
--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය
----------------------------------------

3.1 අරමුදල් උපයෝජනය
----------------------------

ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වාර්තා අනුව, ණය මුදල් මූල්‍යයනය, අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | **2014 දෙසැම්බර් 31 දිනට** | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජාසංස සංරචකය - I | 190 | 24,768.4 | 1,257 | 7.58 | 988.29 | 13.58 | 1,769.79 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ල අනුව, ව්‍යාපෘතියේ සංරචකය - I යටතේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 5,733 කට සමාන එජඩො මිලියන 43.75 ක් වියපැහැදම් කිරීම සඳහා අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද,

ලැබුණු තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ වෙන්කළ මුදලෙන් සියයට 17 ක් නියෝජනය වන රු.මිලියන 988.29 කට සමාන එජඩො මිලියන 7.58 ක ණය මුදල් ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් ලැබී තිබුණි.

(ආ) ලැබුණු තොරතුරු අනුව, ව්‍යාපෘතියේ සංරචකය - I යටතේ රු.මිලියන 24,768.4 කට සමාන එජඩො මිලියන 190 ක්වූ වෙන් කිරීමෙන් 2014 දෙසැම්බර් 31 දිනට මුළු වෙන් කිරීමෙන් සියයට 07 ක් නියෝජනය වන රු.මිලියන 1,769.79 කට සමාන එජඩො මිලියන 13.58 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එබැවින් ව්‍යාපෘතියේ ඉතිරි වර්ෂ 04 ක කාල පරිච්ඡේදය තුළ සම්පූර්ණයෙන් ව්‍යාපෘතියේ වෙන් කිරීම් උපයෝජනය කිරීමේ හැකියාව සැක සහිතය.

(ඇ) ත්‍රිපෝෂ වැඩ සටහනේ මූලධන හා පුනරාවර්තන පිරිවැය සඳහා ව්‍යාපෘතිය විසින් රු.මිලියන 50 ක් වූ වෙන් කිරීමක් කර තිබුණද, 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 10.64 ක මුදලක් පමණක් වැය කර තිබුණි.

**3.3 භෞතික ප්‍රගතිය**

---------------------

ව්‍යාපෘතියේ සංරචකය - I යටතේ ඉටුකරගත යුතු භෞතික ඉලක්ක වියපැහැදම් සම්බන්ධ දර්ශක (Disbursement Link Indicators) 03 ක් මත පදනම් වේ. එම වියපැහැදම් සම්බන්ධ දර්ශකවලට අදාළ භෞතික ඉලක්ක ඉටුකර ගැනීම පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අභ්‍යන්තර රෝගී මරණ තොරතුරු පද්ධතියක් (Indoor Morbidity Mortality Return System) ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 21 ක් වූ වෙන් කිරීමක් සලසා තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 4.93 ක් පමණක් ව්‍යාපෘතියට ලැබී තිබුණි. ඉන් රු.මිලියන 3.37 ක මුදලක් පද්ධතිය සඳහා උපකරණ ප්‍රසම්පාදනය සඳහා රෝහල් 12 කට ප්‍රේෂණය කර තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දිනට රෝහල් 10 ක් විසින් රු.මිලියන 2.48 ක මුදලක් පමණක් වැය කර තිබුණි. කෙසේ වුවද, පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ භෞතික ප්‍රගතියට අදාළ කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) රෝහල් 28 ක සෞඛ්‍ය ආරක්ෂණ ගුණාත්මක තත්ත්වය හා ආරක්ෂක ඒකක ස්ථාපිත කිරීම සඳහා අමාත්‍යාංශය විසින් රු.මිලියන 17.23 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ වැය කර තිබුණි. මේ පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- එම ඒකකවල කාර්යයන් ආරම්භ කළේද යන්න තීරණය කිරීම සඳහා රෝහල් 15 කින් 2014 දෙසැම්බර් 31 වන විටත් සාක්ෂි ලැබී නොතිබුණි.

- කොළඹ ද සොයිසා කාන්තා රෝහල සහ මහනුවර ශික්ෂණ රෝහල සඳහා රු.මිලියන 1.12 ක් වූ වෙන් කිරීම් උපයෝජනය කර නොතිබුණු අතර, එම ඒකක ස්ථාපිත කිරීම සඳහා රෝහල් බලධාරීන් විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව ඒ අනුව නිරීක්ෂණය විය.

- එම ඒකක සඳහා අමාත්‍යාංශය විසින් රු.මිලියන 5.60 ක පිරිවැයකට පරිගණක හා උපාංග ප්‍රසම්පාදනය කර තිබුණු අතර කුරුණෑගල මූලික රෝහලේ බලධාරීන් විසින් එම වත්කම් රෝහලට අවශ්‍ය නොවන බව දක්වමින් ප්‍රතික්ෂේප කර තිබූ බව විගණනයේදී අනාවරණය විය.

(iii) වියපැහැදම් සම්බන්ධ දර්ශක -05 යටතේ සමාලෝචිත වර්ෂය තුළ මාතෘ හා ළමා සෞඛ්‍ය සායන 1,743 ක් පැවැත්වීම සඳහා අපේක්ෂා කර තිබුණද, එම සායන 1,627 ක් පමණක් පවත්වා තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය විසින් ට්‍රිපල් එනර්ජි ලීනියර් ඇක්ස්ලරේටර්ස් (Triple Energy linear Accelerators) 14 ක් සැපයීම සඳහා රු.මිලියන 3,197 කට සමාන එජඩො මිලියන 24 ක පිරිවැයකට විදේශ සමාගමකට 2013 දෙසැම්බර් 03 වන විට කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. කෙසේ වුවද, 2014 දෙසැම්බර් 31 දිනට එක් ඇක්ස්ලරේටරයක් පමණක් සපයා තිබුණි. තවද සැපයුම් සැලැස්ම අනුව, 2015 මාර්තු 31 ට පෙර සැපයිය යුතු ඇක්ස්ලරේටර් 08 ක් 2015 අගෝස්තු 31 වන විටත් සපයා නොතිබුණි.

(ආ) රු.මිලියන 2,754 කට සමාන එජඩො මිලියන 20 ක පිරිවැයකට වෙනත් ලීනියර් ඇක්ස්ලරේටර් 17 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා සැපයුම්කරුවකු තෝරා ගැනීමට රජයේ ප්රසම්පාදන පරිපාටිය අනුගමනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. සැපයුම් කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණද, සැපයුම්කරු විසින් විධිමත් ගිවිසුමක් 2014 දෙසැම්බර් 31 වන විටත් අත්සන් කර නොතිබුණි.

(ඇ) තඹුත්තේගම මූලික රෝහල විසින් එන්ඩොස්කොපි යන්ත්‍රයක් ඉල්ලුම් කර නොතිබුණද, එම රෝහල සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.මිලයන 11.41 ක පිරිවැයකට එන්ඩොස්කොපි යන්ත්‍රයක් ප්‍රසම්පාදනය කර තිබුණි. තවද, රු.මිලියන 9.84 ක් වූ අඩුම ලංසු මිල ඉදිරිපත් කළ සැපයුම්කරු වෙනුවට රු.මිලියන 11.41 ක ඉහළ ලංසු මිල ඉදිරිපත් කළ සැපයුම්කරු වලංගු හේතුවක් නොමැතිව තෝරා ගෙන තිබුණි.

3.5 ව්‍යාපෘති අරමුණුවලට බාහිරව උපයෝජනය කළ අරමුදල්

---------------------------------------------------------------

වියපැහැදම් සම්බන්ධ දර්ශක ක්‍රියාත්මක කිරීම සඳහා ණය මුදල්වලින් වැයකළ රු.මිලියන 508.33 ක මුදලක් හා ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු මුදල්වලින් වැයකළ රු.මිලියන 2,217 ක මුදලක්, අදාළ වියපැහැදම් සම්බන්ධ දර්ශක යටතේ දක්වා ඇති අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කර නොතිබුණි.